# නුවර යුගයේ වාස්තුවිද්‍යාත්මක අගයන්ගෙන් සමන්විත ගඩලාදෙණිය විහාරය ගැන අධ්‍යනයක්

බී.බී.අයි. ප්‍රනාන්දු

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
wotzefernando94@gmail.com

ප්‍රමුඛ පදඃ ගඩලාදෙණිය, වාස්තු විද්‍යාව,ප්‍රතිමා ගෘහය

## හැඳින්වීම

ගම්පොළ යුගයේ සුවිශේෂී කලා නිර්මාණ ලක්ෂණ කැටි කොට ගත් විහාර ස්ථානයක් ලෙස ගඩලාදෙණිය විහාරය ඉතිහාසයට එකතු වේ.ගම්පොළ යුගයේ ප්‍රථම රජු වශයෙන් සැලකෙන Vවැනි බුවනෙකබාහු රජු සමයේ සීලවංශ ධර්ම කීර්ති ප්‍රථම සංඝ රාජයාණන් වහන්සේ විසින් ඉදිකරන ලද යැයි සැලකෙන මෙය ගම්පොළ යුගය තුළ හමුවන උසස් වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ පිළිබිඹු කරන නිර්මාණයකි.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස දත්ත රැස් කිරීම සඳහා ප්‍රාථමික ප්‍රාථමික මූලාශ්‍රය ද්විතීක මූලාශ්‍රය අධ්‍යනය කළ අතර ක්ෂේත්‍ර ගවේෂණය සිදු කර ලබා ගන්නා තොරතුරු අනුව යමින් මෙම පර්යේෂණය සිදු කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කොළඹ මහනුවර මාවතේ හමුවන පිළිමතලාව නගරයේ නැගෙනහිර කෙළවරේ වූ ඇඹිල්මීගම දවුලගල මාවතේ සැතපුම් භාගයක් පමණ යන විට උතුරේ සිට දකුණට විහිදුණු දිගගල් තලාව නම් ගල් තලාවක් හමු වේ.එම ගල් තලාව මත දෙමහල් විහාර මන්දිරය හා දේවාලය ඇතුළු මෙම විහාර සංකීර්ණය පිහිටා ඇත.

පඨීමාසරයෙහි මූලික සැලැස්ම අධ්‍යයනය කරන විට මෙහි පළමු වැනි මහලෙහි ප්‍රතිමාගරය දෙව්රජගේ ගර්භ විමානය යන අංගවලින් සංයුක්ත ගෘහ සංකීර්ණයකි.එය සාර්ථක ලෙස බුදු ගෙයක් හා දේවාලයක් ඒකාබද්ද කළ සැලැස්මකි.මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ප්‍රතිමා ගෘහයේ පැතලි වහල මත ගඩොලින් කළ දාගැබ් ආකෘතිය හැර වෙනත් තැනක ගඩොල් අමුද්‍රව්‍ය ලෙස යොදා ගෙන නොමැත.මෙම දාගැබ මගින් බෞද්ධ මුහුණුවරක් ගොඩනැගිලි සංකීර්ණයට ලබා දී ඇත.දෙව්රජගේ යනු උපුල්වන් දේවාලය වන අතර එය හින්දු දේවාලයට ආවේණික ශිඛරයකින් සමන්විත වේ.නමුත් මෙහි වැඩ සිටින්නේ හින්දු දෙවියෙකු නොවන බව පැහැදිළිය.

මෙම විහාරය තෙමහල් නිර්මාණයක් බවට තොරතුරු සඳහන් වේ.ඒ අනුව බිම් මහළ පළමු වැනි මහළ ලෙස සලකා ඇති අතර ගලින් කරන ලද වහලය හා සම්බන්ධ අන්තරාලය හා මණ්ඩපය දෙවැනි මහළ ලෙසද තුන්වැනි මහළ ලෙස මුදුනේ පිහිටි ගර්භ විමානය සලකා ඇත.මුළු ගොඩනැගිල්ලේ දිග අඩි 76කි.පළල අඩි 37කි.අන්තරාලය සහිත කොටසේ පළල අඩි 16කි.අධිෂ්ඨානයේ සිට හර්මිකාව දක්වා අඩි 49ක් උසින් යුක්තය.ගෘහයේ බිම් මහළ පළමු වැනි මහළ ලෙසත් අන්තරාලය හා මණ්ඩපයේ ශිලාමය වහල දෙවැනි මහළ ලෙසත් ඉහළ ඇති චෛත්‍ය හැඩයෙන් යුක් ගර්භ

විමානය තෙවැනි මහළ ලෙස සළකා මෙම විහාරය තෙමහල් ලෙස සළකා ඇත.

පිහිටි ගල් තලාවේ සකසා ඇති අඩි එක හමාරක් පමණ උස බොරදම් සහිත ශිලාමය අත්තිවාරම අධිෂ්ඨානය නම් වේ.මෙකී අත්තිවාරමද පීඨය හරස් ලීස්තරය දෙකෙළවරින් කපා හළ තුමුදය යන කොටස්වලින් සංයුක්ත වේ.අත්තිවාරමේ වූ බොරදම් පේළි දෙක අතරින් හතරැස් ආකාරයෙන් එළියට පැන්නූ කුළුණු සමූහයකි.නමුත් මෙම පැන්නුම් කුළුණු එක සමාන උසින් යුක්ත නොවේ.

පළමුවැනි මහලේ වහලය සේ සැලකෙන ද්වාර මණ්ඩපයේ වහල පැතලි ගල් පුවරුවලින් ආවරණය කර තිබේ.එකී ගල් පුවරු මත සෙසු මහල් දෙක වේ.ගර්භයත් අන්තරාලයත් ඇතුළත් වන එම කොටස මහල් දෙකක් ලෙස ඉහළට නැගී ඇත්තේ ස්තර දෙකක් හා අටැස් ශිඛරයක් වශයෙන් ක්‍රමයෙන් කුඩා වෙමින්ය. දෙ වැනි මහල පිහිටා ඇත්තේ පළමු වැනි මහලේ ප්‍රස්තරය මත වේ. එහි මධ්‍යයේ පියස්සක් ලෙස පිටට පන්නා යන ආකාරයට නිර්මාණය කර ඇති කොටස ගොඩනැගිල්ල වටාම විහිදේ.එහි පිට පැත්තේ චාම්බවකින් යුක්ත පද්මයක හැඩයකි. ඇතුළත බොකු ගැසුණු හැඩයකි.මෙහි මුදුණේ මුහුණ පසකට හරවා ඉදිරියට දිව යන ව්‍යාඝ්‍ර රූ පෙළකි.

ද්වාර මණ්ඩපය සේ සලකනු ලබන දොරටුව මත වූ පැතලි වහල විජයනගර් ගෘහනිර්මාණ ශිල්පයට නෑකම් කියන ස්ථම්භ යුවලකින් රැඳී තිබේ. කෙළවර ඇති මධ්‍යස්ථම්භය හැර සෙසු කුළුණු දෙක හතරැස් හා අටැස් හැඩයෙන් යුක්ත කොටස්වලින් හැඩගැන්වී ඇත. ඉහත කී කණුවල සිව්රැස් කොටස්වල හින්දු දේව රූප , සත්ව රූප, ලියවැල් හා පක්ෂි රූප මදක් උන්නතව පිහිටුවා ඇත. ප්‍රධාන කුළුණුවල මුදුන් කොත් තියුණු දාර සහිත පේකඩකින් සමන්විතය. මේ කුළුණු සම්බන්ද කොට දෙපසින් සිහින් අෂ්ඨ හැඩැති කුළුණු දෙක බැගින් විහිදෙයි. ලැග සිටින සිංහයෙකුගෙන් මෙම කුළුණු ආරම්භ වේ. කුළුණු හිස් මත සිංහ රුව බැගින් දක්නට ලැබෙයි. තවද සිංහ හිස් මත සිංහ රුව බැගින් දක්නට ලැබෙයි. කුළුණු හිසෙහි වූ සිංහයා ලැග සිටින්නේ ඵලකයක් මත ඉහත සඳහන්කර පේකඩ මුනින් හැරවූ නෙළුම් පොහොට්ටුවක් සහිත දඟර ලියවැලකින් සමන්විත වේ. දෙපස වූ කුළුණු ප්‍රධාන කුළුණට සම්බන්ධ වී ඇත්තේ නාටක රූ සහිත තුනී පටියෙනි. අර්ධ මණ්ඩපයේ බොරදම් සහිත අත්තිවාරම් මුහුණත එකිනෙකට වෙනස්වූ නාට්‍ය සහ වාදක රූවලින් යුක්ත වන අතර එමගින් විවිධ නර්තන ඉරියව් නිරූපණය කරයි.

ගර්භගෘහය යනුවෙන් සලකනු ලබන මෙම ගොඩනැගිල්ලෙහි ප්‍රධාන පිළිම වහන්සේ මකර තොරණක් යට වජ්‍රාසනයක් මත වැඩ සිටින අතර ශරීරයට ඇලී ඇති තරංග රේඛාවන්ගෙන් යුක්ත සිවුරක් වේ. මකර තොරණද වාමන රූ ද්විත්වයක් මත නිර්මාණය කර ඇත. ගර්භගෘහයේ දක්නට ඇති මල් ආසනය දිගින් අඩි 12 අගල් 5 , පළල අඩි 2 අගල් 5කි. ආසනය පහළ සිට පාදම පට්ටය පද්මය යන බොරදම්වලින් සමන්විතය. ගර්භ ගෘහයේ වහල දෙපස වූ ගල් කණු ආකෘතියක් මත එකින් එක සම්බන්ධ වන සේ ගල්පුවරු පේලි 7ක් සැකසී ඇත. එහි මුදුනේ සිවුරැස් කොටුවකි. මෙහි නෙළුම් මල් මෝස්තරයක් දක්නට ඇත.

මෙහි අන්තරාලයේ උතුරු පසින් විශාල දොරටුවකි.මෙම දොරටුවෙහි කොටස් 5ක් ඇති අතර කිඳුරු රූ ඇඳි ලියවැල්,නාරිලතා,නෙළුම් මල් ඇඳි මොස්තර දක්නට ලැබේ.

මෙම ගෘහ නිර්මාණ ශිල්පය දකුණු භාරතයේ ගෘහ නිර්මාණ ශිල්පයට බෙහෙවින් සමානකම් දරණු ලබන බව මෙහි වාස්තුවිද්‍යාත්මක අධ්‍යයනයේදී ගම්‍ය වේ.මෙහි බෞද්ධ හා හින්දු ගෘහ නිර්මාණ ශිල්පීය සංකල්පයක් ගැබ් වී ඇති බව පෙන්නුම් කරයි.විහාරයේ ආරක්ෂාවට මහනුවර කලා සම්ප්‍රදාය තුළ වඩාත් ප්‍රචලිත්වයක් දැරූ දේව සංකල්පයට ඉඩහසර මෙහිදී ලබා දී ඇති අතර ඒ හින්දු දෙවිවරු නොව බෞද්ධ දෙවිවරු වේ.

මෙම ස්ථානය අතීත උරුමය පිළිබඳ තොරතුරු ලබා දෙන මහනුවර යුගයේ සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක කලාත්මක ලක්ෂණයන් පිළිබිඹු කරන වැදගත් පුරාවිද්‍යාත්මක ස්ථානයක් වන අතර ඊට යොමු වී ඇති අවදානය අවම වේ.මෙකී විශිෂ්ට නිර්මාණය ආරක්ෂා කර මහජන අභිප්‍රේරණය ඇති කිරීමට විධිමත් ක්‍රමවේදයක් ඇති කළ යුතුය.එවිට අපේ උරුමය මතු පරපුරටත් වඩාත් සුරක්ෂිතව රැක දීමට හැකියාව තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*පියනන්ද හිමි,අම්බාගේ. **ගම්පල යුගයේ මූර්ති ශිල්පය.** මධ්‍යම සංස්කෘතික අරමුදල.*